නිපුණතාවය 1 - කාලීන ප්‍රතිලාභ නෙලා ගැනීමට පරිගණකය සහ එහි විභවය ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 1.1 - මූලික තැනුම් ඒකක රූප සටහන ඇසුරින්,පරිගණක පද්ධතිය විස්තර කරයි.

නවීන පරිගණකවල සියලුම උපාංග පොදු බසයක් හරහා පරිගණකයට සම්බන්ධ වන හෙයින්,ඒවා පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කළ හැකිය.

1.ආදාන/ප්‍රතිදාන උපාංග-

1.ආදාන උපාංග-දත්ත සහ උපදෙස් පරිගණකයට ඇතුළත් කිරීම සඳහා යොදා ගන්නා උපාංග

2.ප්‍රතිදාන උපාංග-පරිගණකයෙන් තොරතුරු ලබා ගැනීමට යොදා ගනු ලබන උපාංග

3.ආදාන/ප්‍රතිදාන උපාංග-ආදාන සහ ප්‍රතිදාන යන ක්‍රියා දෙකම සඳහා යොදා ගත හැකි උපාංග

4.ආචයන උපාංග-පසු ප්‍රයෝජනය සඳහා දත්ත සහ තොරතුරු ගබඩා කොට තබා ගැනීම සඳහා යොදා ගත හැකි උපාංග

2.සැකසුම් උපාංග -

දත්ත,තොරතුරු බවට පත් කිරීම සඳහා යොදා ගැනේ.ක්ෂුද්‍ර සකසනය සහ අනෙකුත් සකසන සහ චිප(chips) මෙයට අයත් වේ.

අභ්‍යාස

1.ආදාන උපාංග,ප්‍රතිදාන උපාංග,ආදාන ප්‍රතිදාන උපාංග සහ ආචයන උපාංග සඳහා උදාහරණ දෙක බැගින් දෙන්න.

2.මෘදුකාංග යනු කුමක්ද?එය වර්ගීකරණය කර උදාහරණ සමඟ පැහැදිලි කරන්න.